# පාලිත ගණේවත්තගේ ඇවිත් නොරටක

ආචාර්ය
**සුනන්දා තිලකරත්න**






ඡායාරූපය වරුණ ශාමින්ද

***ශ්‍රී ලංකාවේ සිට සිය දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා ඔස්ට්‍රේලියාව බලා පැමිණි ශ්‍රී ලාංකික පවුලක කතාන්දරය පාලිත ගණේවත්තගේ අලුත්ම කෘතිය වන 'ඇවිත් නොරටක' ග්‍රන්ථයට වස්තු විෂය වී ඇත. මේ එම ග්‍රන්ථය පිළිබඳ කෙටි හැඳින්වීමකි.***

තම කුඩා දරුවන් දෙදෙනා වන ප්‍රසංග සහ අවන්ති සමගින් සුනිමල් සහ නිර්මලී ඔස්ට්‍රේලියාවට සේන්දු වීමට ඔන්න මෙන්න කියා තිබියදී ගුවන් යානයේ ඇතිවන සංවාදයෙන් කතා පුවත ඇරඹෙයි.

*''පුතා දුව දැන් දෙන්නම සීට් වල ඉඳගෙන සීට් බෙල්ට් තද කරගන්න. ප්ලේන් එක ලෑන්ඩ් කරන කොට හිටගෙන ඉන්න හොඳ නැහැ. ඇහුනෙ නැද්ද දැන් කිව්වා.''*

*මහ හඬ නගමින් යානය බිමට බට විට මෙතෙක් වේලා නිහඬව සිටි නිර්මලී සැනසුම් සුසුමක් හෙලුවාය.*

මෙරටට පැමිණි ඔවුන් ටික දිනක් නතර වූයේ සුනිමල්ගේ හිත මිතුරු ජයන්ත සමගිනි. ජයන්ත මෙහි වසන්නවුනගේ විස්තර සුනිමල් සමග පවසයි.

*''මෙහේ එහෙම තමයි හැම කෙනාටම වගේ වාහනයක් තියෙනවා. සමහර ගෙදරවල කාර් දෙක තුන තියෙනවා.... තම සැමියා ජයන්ත සමග කරන කතා බහට සවන් දෙන නිර්මලී තව වසර කිහිපයකින් තම පවුලටත් එවැනි සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීමට අවස්ථාවක් ලැබෙනු ඇතැයි සිතුවාය.*

එතැන් සිට අනුපිළිවෙලින් කතාව දිග හැරෙන්නේ ඔස්ට්‍රේලියාවට මෑතකදී සංක්‍රමණය වුණු සියලුම දෙනා කළ යුතු වැඩ රාශිය පිළිබඳ විස්තරයකිනි. රැකියාවක් සඳහා සී ඊ එස් ආයතනයේ ලියා පදිංචි වීම, සමාජ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වීම. වාහන බලපත්‍රයක් ගැනීම. බැංකු ගිණුමක් විවෘත කිරීම වැනි දේවල් තම මිතුරු ජයන්තගේ සහය ඇතිව කරගන්නා සුනිමල් ශ්‍රී ලංකාවේදී කටයුතු කර ගැනීමේදී ඇති වන අපහසුතාවන් මෙනෙහි කරයි.

*''මෙහෙ හරිම ලේසි වගේ කාර්යාලයකට ගිහිල්ල වැඩක් කර ගන්න, සුනිමල් තම සිතට ආ අදහස නොවළහා හෙළි කළේය.*

*''ඒක නම් ඇත්ත තමයි. ලංකාවෙ ඉඳල ආපු ගමන් ඒක හොඳට දැනෙනව. අපේ රටේ කොච්චර අමාරුද මේ වගේ වැඩක් කරගන්න'' ජයන්ත කීවේය..*

මෙරටට ආක්‍රමණය වන සිංහල පවුල් වලට පොදු අත් දැකීම් රැසක් මතකයට නංවමින් සුනිමල් හා නිර්මලීගේ අලුත් ජීවිතය පිළිබඳ තොරතුරු හෙළි වෙයි. මිතුරෙකුගේ ගෙදරක සුළු කලක් නැවතී සිටීමල් කුලියට නිවසක් ගැනීම. රැකියා සෙවීම, වාහනයක් මිලදී ගැනීම, දරුවන් පාසැල්වලට ඇතුළත් කිරීම වැනි සිද්ධීන් සිරිලක තමන් දැන සිටි පරිසරය අත් දැකීම් සමග සංසන්දනය කරමින් ක්‍රමයෙන් ඉදිරිපත් කර ඇත.

ලංකාවේදී මෙන්ම මෙහිදීද තම දරුවන් උසස්ම පාඨශාලාවකට ඇතුළ් කර උසස් අධ්‍යාපනයක් ලබාදීම මෙහි පැමිණෙන දෙමාපියන්ගේ ප්‍රධාන අරමුණයි. එම අභිලාෂය මුදුන් පත් කර ගැනීම සඳහා අමතර පංති වලට දරුවන් යැවීමට දෙමාපියන් දක්වන්නේ දැඩි උනන්දුවකි. බොහෝ විට ඔවුනගේ මිනුම් දණ්ඩ වන්නේ අනෙක් ලාංකික පවුල්වල දරු දැරියන්ගේ ජයග්‍රහණයි.ඒ හා සමානවම හෝ ඊට ඉහළින් තම දරුවන් යනු දැක්ම ඔවුනගේ එක් අභිප්‍රායකි.

උපකාරක පන්ති සඳහා සති අන්ත වලදී අවන්ති රැගෙන යාමට අවශ්‍ය බව නිර්මලී සුනිමල්ට කී විට සුනිමල් ඒ අදහසට විරුද්ධ වෙයි.

*''නිම්මි කවුරුත් කරාට අපිත් ඒව කරන්න ඕන නැහැ''ග සුනිමල්ගේ කට හඬේ ඇත්තේ මඳ නොසන්සුන්තාවයකි.'*

*''ඇයි මෙයා විතරද ඒ පංතිවලට යන්නෙ. මෙයා වගේනෙ අනෙක් ඔක්කොම ළමයි. ඒ ළමයි කොහොමද ඒ ටෙස්ට් එක පාස් වෙලා හොඳ ඉස්කෝල වලට යන්නේ.''*

උපකාරක පංතිවලට යැවීම එතැනින් කෙළවර නොවේ.

''ප්‍රසංග දැන් එකොලහ වසරේ. ලබන අවුරුද්දේ එච් එස් සී කරනවනෙග දැන්මම ටියුෂන් පන්ති ගැන හොයල බලන එක නුවණට හුරුයි නේද?''

දෙමාල්ලන් අතර නිරන්තරයෙන් උණුසුම් කතා බහ ඇති වන්නේ දරුවන් වෙනුවෙනි.

*''ලංකාවේ ටියුෂන් පංති ගියාට මේ රටේ මොනවටද?''*

*''ඔයා කියන්නෙ හරි කතාවක්නෙ තාත්ති. ලංකාවෙ ළමයි මෙහෙ ඔක්කොම ඉයර් ඉලවන් ඉඳලම ටියුෂන් යනවා.''*

මෙරටට පැමිණි පසු තම රටල දැය බස දරුවනට අහිමි කිරීමට අකැමැති දෙමාපියන් සිංහල පාසැලට දරුවන් යවන්නට දක්වන්නේ ඉමහත් උනන්දුවකි. එහෙත් කලකදී දරුවන් සිංහල නාට්‍යවල රඟ දැක්වීමට පුහුණු වන්නේ ඉංග්‍රීසි අකුරින් ලියා ගත් සිංහල දෙබස් පුහුණු වීමෙනි. කෙමෙන් කෙමෙන් සිංහල බස අමතක වන දරුවන් සිංහල ඉගෙනීමට බල කිරීම තමන්ට කරනු ලබන කරදරයක් ලෙස සලකයි.

*''මං කවදාවත් පාවිච්චි කරන්නැති භාෂාවක් මොකටද ඉගෙන ගන්නේ?'' අවන්ති ඉංග්‍රීසියෙන් කීවාය.*

*මිණිබිරියගේ ඒ කියුම තමාගේ මුහුණට දමා ගැසීමක් ලෙසිනි පලිපානට සිතුණේ.*

*''ඒක හරි පුදුම කතාවක්නෙ ළමයාග තමන්ගෙ මවු බස සිංහල භාෂාව අපි ඉගෙන ගන්න එපායැ.,*

*''අයි ලර්න් ඉංග්ලිෂ්. නොට් සිංහල.''*

*''ඉංග්‍රීසි ඉගෙන ගත්තට සිංහල අමතක කරන්න පුලුවන්ද?''*

*''සීයා. අයි හෑව් නෝ ටයිම් ඇට් ඕල්. යූ ආ ඩිස්ටර්බින් මී.''*

අවන්තිගේ මේ අදහස මුළු මහත් සංක්‍රමණික පරපුරේ දරු දැරියන් සිය 'දෙමාපියන්ගේ මව් බස' පිළිබඳ ආකල්පය හුවා දක්වන්නකැයි සිතේ.

ශ්‍රී ලංකාවේ දේ පොළ පිළිබඳව ඇති වන ආරාවුල් ලංකාවේ වසන තම දෙමාපියන්ගේ අභාවය. වයසක දෙමාපියන් මෙහි ගත කරනු ලබන අසරණ ජීවිතයල පුරවැසි භාවය ප්‍රදානය කිරීමේ උත්සවය යනාදී මෙරට ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිතයන්හි විවිධ පැතිකඩ පාලිතගේ පෑනට හසුවන්නේ චිත්‍ර ශිල්පියෙකුගේ තෙලි තුඩට හසුවන ඉතා සියුම් විස්තර සහිත සිත්තමක් ලෙසිනි.

මෙරටෙහි උසස් අධ්‍යාපනය ලබමින් කෙමෙන් වැඩෙන දරුවන් ගත කරන්නේ ස්වාධීන ජීවිතයකි. එම ජීවිත තුළින් දිස්වන්නේ ශ්‍රී ලාංකික සාර ධර්ම නොව බටහිර සංස්කෘතියට හා චින්තනයට මනාව හැඩ ගැසුණු දූ දරුවන්ය. ඔවුන් අනුගමනය කරන්නේ මෙරටේදී තමන්ට හුරු පුරුදු වන ජීවන රටාවයි.

තරුණ වියට පා තබන දරුවෝ දෙමාපියන්ගේ අභිප්‍රායන් සුන් කරමින් අන් ජාතික තරුණියක හා තරුණයකු සමග මිත්‍ර සබඳතා ඇති කර ගනිති. තම පුතණුවන්ගේ සම්බන්ධයටත් වඩා සුනිමල් නිර්මලී යුවළට දැඩි වේදනාවක් ගෙන දෙන්නේ තම දියණිය වන අවන්ති මෙහිදී හමු වූ සුදු තරුණයෙකු හා පවත්වන මිත්‍ර සබඳතාවයයි.

*''කවුද ඔය ජේසන් ? කොච්චර කල්ද දැන් යාලු වෙලා?''*

*''අයි ටෝල්ඩ් යූ. මයි බෝයි ෆ්‍රෙන්ඩ්.,*

*''බෝයි ෆ්‍රෙන්ඩ්? සිංහල ළමයෙක් එක්ක යාලු වෙන්ඩ කියල නේද අම්ම කියල තියෙන්නේ''*

*''තාත්තා ආ යූ මෑඩ්''*

*''මෑඩ් ? අපි දැන් පිස්සො වගේ තමයි උඹල දෙන්නටම පේනව ඇත්තේ. අම්ම දැන ගත්තොත් මොනව කර ගනීද?''*

*ජේසන් දරුවකුද සිටින විවාහකයෙකු බව අවන්තිගේ මුවින් පිටවූ විගස සුනිමල් කෑ ගැසුවේය.*

*''වයි ආ යූ ෂවුටින් තාත්තා?''*

*''උඹට පිස්සුද සුද්දෙක් යාලු කර ගත්ත මදිවට කසාද බැඳල දික්කසාද වෙච්ච මිනිහෙක් යාලු කර ගන්න. අම්මාට දැන් පිස්සු වැටෙයි''*

සුනිමල්ගෙන් මෙම පුවත දැන ගත් පසු මහත් කෝපයට හා ශෝකයට පත් නිර්මලී නොඉවසිල්ලෙන් බලා සිටියේ අවන්ති ගෙදර පැමිණෙන තුරුය.

*'කාමරයේ වැතිර සිටි නිර්මලී වහා නැගිට අවන්තිගේ කාමරය කරා දිව ගියාය.*

*''උඹ දැන ගනින්. මම උඹේ අම්ම නොවෙයි ඔය සුද්ද එක්ක තියෙන යාලු කම අත් ඇරියෙ නැත්නං. තේරුණාද?'' '*

*''මම මේ ගෙදරින් යනවා.''*

*''ඔව් පලයං අර දික්කසාද වෙච්ච සුද්ද එක්ක. ගිහින් උගෙ ගුබ්බෑයමේ ලැගපං.''*

මවගේ කරදරයෙන් බේරීමට අවන්ති සිය පෙම්වතා වූ ජේසන් හා පදිංචියට යයි. මහත් හිත් වේදනාවෙන් හා කම්පනයෙන් පසුවන නිර්මලී හඬා වැළපෙයි.

'අනේ තාත්ති අපි මේ ළමයින්ගෙ මේව දකින්නද මේ රටට ආවෙ? නිර්මලී හඬා වැළපුනාය. අරය අර ඇඟපත ඇරගෙන යන අරාබි කෙල්ලෙක් එක්ක රවුම් ගහනවා. ඔන්න දැන් මෙයා දික්කසාද වෙච්ච ළමයෙකුත් ඉන්න සුද්දෙක් එක්ක යාලුවෙලා. කාටද මේව ඉවසන්න පුලුවන්? මගේ පපුව පැලිල මැරෙයි.'

සුනිමල් ඇය සැනසීමට උත්සාහ කරයි.

' ''දුක් වෙන්න එපා නිම්මි. ඔහොම දේවල්ද මිනිස්සුන්ට වෙන්නෙ'' යි සුනිමල් ඇය සනසන අටියෙන් කීවේය. ''අර වෙත්තසිංහගෙ ලොකු ළමය මතකද ඩ්‍රග්ස් වලට පුරුදු වෙලා කලක් හිටියෙ පිස්සෙක් වගේ. ඊට පස්සෙ කොහෙද රීහැබිලිටේෂන් කෑම්ප් එකකත් හිටියලු මාස ගණනක්''

අපමණ කැප වීමකින් දරුවන් හදන සිංහල පවුල් බොහොමයකට උරුම වන ඉරණම මේ හා සමානය.

මෙම කතාව තුළ අතරින් පතර හෝ දැක්වෙන ව්‍යාංගාර්ථ නොමැත. ඇත්තේ කතාව ආරම්භයත් කෙමෙන් දිග හැරෙනා සිද්ධීන් හා එහි අවසානයත් තුළින් ගම්‍යවන අර්ථය පමණි.

මුලදී මෙරටට පැමිණීමට එතරම් කැමැත්තක් නොදැක් වූ නිර්මලී කොළඹ බෝම්බ ප්‍රහාරයක් සිදු වූ දින සිය කුඩා දරුවන් දෙදෙන රාත්‍රී හයත් පසුවන තුරු පාසල හමාර වී ගෙදර නොපැමිණි දින මහත් සේ බියට පත් වූවාය. 'දරුවන්ගේ අධ්‍යාපන හා අනාගතය සඳහා පිටරටකට යාමට ඇය තීරණය කරන ලද්දේ එදින ඇයගේ සිතට පිවිසි බිය හා සන්ත්‍රාසය විසිනි.'

එහෙත් කතාව අවසානයේ ඇය පවසන්නේ

''මදැයි පිටරටකට ආවා මුන්ට උගන්නන්න කියල. කොළඹ බෝම්බයකට අහුවෙලා මැරුණ නම් මීට හොඳයි.''

දරුවන් දෙමාපියන් පමණක් නොව තම ජීවිතයෙහි සැඳෑ සමය මෙහි ගත කරන පලිපාන මහතාගේ සිතිවිලි ධාරාවන් ද පවුලේ හැල හැප්පීම් මැද විස්තර වෙයි.

' සිංහල ගැමි සංස්කෘතියේ සුවඳ විඳිමින් එහි හැදී ජීවත් වූ තමා මුල් උදුරුවා හරින ලද ගසක් මෙන් මේ විතණ්ඩවාදී සමාජයට ගෙනත් දමන ලද අප්‍රාණික වස්තුවක් බවට පත්ව තිබේ.''

තම දරුවන් මුණුපුරන් මෙහි ගෙවන ජීවිතය සමරවික්‍රම මහතා කැටි කරන්නේ මෙසේය.

''දන්නෙ නැද්ද මිස්ට පලිපාන මේ ගොල්ලන්ට හුස්ම ගන්ට බැරි තරම් වැඩනෙ. උදේ නැගිට්ට ගමන් දෙන්නම වැඩට දුවනව. දරුවොත් එහෙමයි. යුනි යනව අරහෙ යනව මෙහෙ යනව කියයි. නැත්තං පස්ස පැත්තට ඉර එළිය වැටෙනකං බුදිය ගනියි. මහ අමුතු ජාතියෙ ජීවිතයක්නෙ මෙහෙ තියෙන්නෙ''

පහසුවෙන් කියවිය හැකි ඉතා සරල භාෂාවෙන් ලියා ඇති මෙම පොත මෙරටෙහි වසන බහුතරයකගේ ජීවිතය ඔවුනගේ අපමණ අපේක්ෂා මනා ලෙස සිත්තම් කරන අතර මෙරට වසන සිංහල ජනතාවගේ ජීවිතය පිළිබඳව කාගේත් අවධානය යොමු විය යුතු මූලික ප්‍රශ්න කිහිපයක් දෙස පාඨක සිත යොමු කරයි. ■

<u>*තරුණ වියට පා තබන දරුවෝ දෙමාපියන්ගේ අභිප්‍රායන් සුන් කරමින් අන් ජාතික තරුණියක හා තරුණයකු සමග මිත්‍ර සබඳතා ඇති කර ගනිති. තම පුතණුවන්ගේ සම්බන්ධයටත් වඩා සුනිමල් නිර්මලී යුවළට දැඩි වේදනාවක් ගෙන දෙන්නේ තම දියණිය වන අවන්ති මෙහිදී හමු වූ සුදු තරුණයෙකු හා පවත්වන මිත්‍ර සබඳතාවයයි.*</u>

**From Page 8**

country like Sri Lanka, poverty is one of main reasons for suicide. It is worth noting that Sri Lanka records one of the highest suicide rate in the world . According police records, the major reasons for suicide in Sri Lanka are poverty, unemployment, breaking up love affairs, divorce, marital problems, mental illness, and failing an exam. Sri Lanka records 40 suicides per 100000 population each year compared with 8 per 100000 in the United Kingdom. Self-poisoning is the main mode of suicide in Sri Lanka and many people admitted to hospitals with self-harm are young aged under 30. It is universally accepted that the mode of suicide is determined by the easy access to the desired mean of self harm. It is less known fact in Sri Lanka that eating oleander seeds is one of the preferred methods of committing suicide. The why of this silent epidemic is unclear but sociologists argue that frustration embedded in Sri Lankan society, particularly among the youth who are well educated in the face of civil war, poverty and higher unemployment may have triggered this crisis. It is surprising to see that if knows someone who has committed suicide is a risk factor for self harm in Sri Lanka. Young people in Sri Lanka have a very little support system such as counseling, treatment options, or telephone hotlines so that they left with no one but the thought of death at the time of self harm.

<u>*In the western world, the most common reason is a feeling of meaninglessness in life and spiritual emptiness amid material wealth and success.*</u>

In the western world, the most common reason is a feeling of meaninglessness in life and spiritual emptiness amid material wealth and success. Most of those who attempt it report feeling that life is not worth living. Feelings of hopelessness and guilt are prevalent among people with depressive disorders and these feelings might induce the depressed individual to commit suicide. Some believe that the act of suicide is a desperate plea for help and others argue that suicidal gestures are ways of manipulating others. Nearly 30% of suicide victims showed some kind of clue or warning sign prior to the act of suicide and those who are involved in prevention of suicide focus on these warning signs. It appears that people who successfully committed suicide are individuals who are unable to get their message through and know of no other alternative other than ending their lives.

Not surprisingly, 10% of the people who commit suicide do so for no apparent reason! Nobody could find any logical reason why they would end their lives. They do not have any declared health, personal, or economic reason for suicide and it is a big puzzle to the family members. Nobody could find any justification, rational explanation why they would choose to end their lives. Suicide rates are highest in old age; about 40% of suicide victims are over 60 and after age 75, the rate is 3 times higher than average. The whites are more prone to suicide than the blacks.

What to do if you find a suicidal person? First thing, trust your instincts that the person may be in trouble. Talk with the person but listening to him is the priority. Without being judgmental, ask a few questions to determine if the person has a specific plan to carry out the suicide. Get professional help immediately and don't leave the person alone.

There is no single therapeutic intervention to deal with suicidal people. The most common ways to treat underlying illnesses associated with suicide are with medication and counseling (talk therapy) or both. Research shows that medication for underlying psychiatric disorders reduces the feelings of suicidality. Cognitive and behavioural therapies aimed at relieving the feelings of suicidal ideation show them alternative solutions to their problems and new ways of looking at the world.